ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

කැලණිය විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව 2011

වාර්ෂික වාර්තාව

2011

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (2) හා 24 (ආ) යටතේ 1995 අංක 01 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයට පත් කර තිබේ. එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු 01 දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන මෙම ආයතනයේ 2011 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම් වාර්තාව හා 2011 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජනිතා ඒ ලියනගේ.
අධ්‍යක්ෂ

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
අධ්‍යක්ෂගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2010 - 2015 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2010.06.28 දින පැවැති 174 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ.
අධ්‍යක්ෂ.

පටුන

කාරණය		පිටු අංකය
01.	ආයතනයේ දැක්ම	01
02.	මෙහෙවර ප්‍රකාශය	02
03.	අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය	03
04.	සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර	04
05.	දේශීය සිසුන් පිළිබඳ විස්තර	04
06.	විදේශීය සිසුන් පිළිබඳ විස්තර	04
07.	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර	05 - 06
08.	අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර	06
09.	පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	07
10.	වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	07
11.	සම්මාන ලැබීම් පිළිබඳ විස්තර	08
12.	ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර	08
13.	පුනරාවර්තන වියදම් විස්තර	09
14.	ප්‍රාග්ධන වියදම් විස්තර	09
15.	ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය)	09
16.	ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය)	10
17.	මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)	10
18.	මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම්)	10
19.	මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2011	11
20.	යටිතල පහසුකම් සඳහා 2011 වර්ෂය තුළ ලැබීම්	11
21.	වෙනත් විස්තර	
	21.1 පුස්තකාලය	11
	21.2 පරිගණක අංශය	11
	21.3 යටිතල පහසුකම් සංවර්ධනය	12
22.	අධ්‍යක්ෂ වාර්තාව	13 - 14
23.	2011.12.31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය	15
24.	2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය	16
25.	විගණකාධිපති වාර්තාව	17 - 23
26.	විගණකාධිපති වාර්තාවට අදාළ පිළිතුරු	24 - 27

1. ආයතනයේ දැක්ම :

දැක්ම

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම
මගින් ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ය
මධ්‍යස්ථානය බවට පත් වීම.

2. මෙහෙවර ප්‍රකාශය :

මෙහෙවර

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මෙහෙවර වනුයේ, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්‍යාත්මක දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා පහත දැක්වෙන අරමුණු හා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම ය.

" මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින් ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම්වලට පදනම් වන පරිසරයක් ගොඩනැගීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැලසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවල නියැලී සිටින ආයතන සමඟ අන්තර් සම්බන්ධතාවන් ගොඩනැංවීම, අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම "

3. අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය :

අ. හැඳින්වීම

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2011 - 2015 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2011.07.22 දින පැවැති 185 වන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

ආ. ජයග්‍රහණ

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

ඇ. අඩුපාඩු

සංයුක්ත සැලැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතු ය.

ඈ. අනාගත සැලසුම්

සංයුක්ත සැලැස්ම සංශෝධනය කරනු ලැබූ අතර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

විෂය නිර්දේශ සංශෝධනය කිරීමේ කටයුතු පළමු සහ දෙවන කාර්තුවලදී ක්‍රියාවට නැංවූ අතර 2010/2011 අධ්‍යයන වසරේ ප්‍රථම වසර සිසුන් සඳහා නව විෂය නිර්දේශය අනුව දේශන ආරම්භ කිරීමට හැකි විය.

විද්‍යායතනයට ප්‍රධාන අඩුපාඩුවක්ව පවතින විදුලි ජනක යන්ත්‍රය මිල දී ගැනීම සඳහා මූලික කටයුතු කරනු ලැබූ අතර 2012 වසරේදී නව විදුලි ජනක යන්ත්‍රය ස්ථාපනය කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කරමි.

ආයතනය සඳහා පවතින භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ආයතනය වටා ඇති මුඩුබිම් අත්පත් කර ගැනීම සඳහා කරනු ලැබූ ඉල්ලීමට අදාළ වැඩ කටයුතු කාර්ය ඉටු කර ගන්නා තෙක් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරමි.

4. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර :

ආයතනය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	371	30	104
මුළු ගණන		**371**	**30**	**104**

5. දේශීය සිසුන් පිළිබඳ විස්තර :

ආයතනය	පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම 2011	පළමු වසර සිසුන්	2 වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4 වන වසර සිසුන්	5 වන වසර සිසුන්	උපාධිය ලබාගත් මුළු ගණන
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය	B.A.M.S.	ඉංග්‍රීසි		96	99				59
		සිංහල				87	51	38	
මුළු ගණන				**96**	**99**	**87**	**51**	**38**	**59**

6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර :

ආයතනය	පාඨමාලාව	මාධ්‍යය	බඳවා ගැනීම	පළමු වසර සිසුන්	2 වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4 වන වසර සිසුන්	උපාධිය ලබාගත් මුළු ගණන
මුළු ගණන								

7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :

ආයතනය	විෂය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහකාර කථිකාචාර්ය	උපදේශක - -වරුන්
ශල්‍ය ශාලාක්‍ය	ශල්‍ය	සිංහල ඉංග්‍රීසි	-	-	01	-	-	-
	ශාලාක්‍ය	සිංහල	-	-	01	-	-	-
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග	ස්ත්‍රීරෝග	සිංහල	-	-	02	-	01	02
	බාලරෝග	සිංහල						
	ප්‍රසූත තන්ත්‍ර	සිංහල						
ද්‍රව්‍යගුණ විඥාන	ද්‍රව්‍යගුණ විඥාන	සිංහල ඉංග්‍රීසි	-	01	04	-	-	ප්‍රදර්ශක 03
	රස ශාස්ත්‍ර	සිංහල ඉංග්‍රීසි	-	-	02	-	-	
	භෛෂජ්‍ය කල්පනා	සිංහල ඉංග්‍රීසි	-	-	02	-	-	
ආයුර්වේද මූලධර්ම	හින්දි ඉංග්‍රීසි සංස්කෘත	ඉංග්‍රීසි සිංහල	- - -	- - -	- - 01	-	01 බාහිර 02 බාහිර 01ආධුනික	
	පදාර්ථ විඥානය	ඉංග්‍රීසි සිංහල	-	-	-	02		
	ආයුර්වේද ඉතිහාසය	ඉංග්‍රීසි සිංහල				01		
	වෘද්ධත්‍රය	ඉංග්‍රීසි සිංහල				02		
	ශරීර ක්‍රියා නව්‍ය	ඉංග්‍රීසි සිංහල					01ආධුනික	ප්‍රදර්ශක 04
	ශරීර රචනා නව්‍ය	ඉංග්‍රීසි සිංහල					01 බාහිර 01ආධුනික	
	ශරීරරචනා ආයුර්වේද	ඉංග්‍රීසි සිංහල	-			01		
	ශරීර ක්‍රියා ආයුර්වේද					01		
	දෝෂධාතු මලවිඥාන					02	-	-
	ජ්‍යොතිෂ මූලධර්ම						01ආධුනික	
	භූතවිද්‍යාව						01ආධුනික	

චිකිත්සා	රෝග විඥාන	-	-	-			-	-
	කාය චිකිත්සා							
	දේශීය චිකිත්සා							
	අගද තන්ත්‍ර							
	ස්වස්ථවෘත්ත							
	ව්‍යාධිවේදය							
	වෝහාරික වෛද්‍ය විද්‍යාව හා ධූලක වේදය							
	පර්යේෂණ ක්‍රමවේදය							
මුළු ගණන				**01**	**13**	**09**	**10**	**09**

8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර :

ආයතන අංශය/ අංශය	**විධායක කාර්ය මණ්ඩලය**	**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික**	**මාණ්ඩලික**	**කණිෂ්ඨ**	**සුළු සේවක**
චිකිත්සා	-	02	02	-	02
ශල්‍ය ශාලක්‍ය	-	01	01	-	01
ස්ත්‍රීරෝග හා කෞමාරභෘත්‍ය	-	-	02	-	01
ද්‍රව්‍යගුණ විඥාන	-	-	03	01	02
මූලධර්ම + වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය	*01	01	03	03	01
පාලන	02	02	11	07	03
නඩත්තු	-	01	01	04	07
විභාග	01	04	04	01	01
ගිණුම්	02	03	08	-	02
පුස්තකාලය	-	-	03	03	01
පරිගණක	-	02	01	-	01
මුළු ගණන	**06**	**16**	**39**	**19**	**22**

*** ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී**

9. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර :

විෂයය	ප්‍රකාශිත	මුදල් ඉපයීම්	ඉදිරිපත් කිරීම්
අ. පර්යේෂණ ගණන	ශල්‍ය ශාලක්‍ය 04		01
	ද්‍රව්‍යගුණ විඥාන	01	02
ආ. නව සොයා ගැනීම්			
ඇ. සඟරා ගණන			
ඈ. පොත් ගණන			
ඉ. ලිපි ගණන	ද්‍රව්‍යගුණ විඥාන		02
	කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග 05		
ඊ. වෙනත්			
මුළු ගණන		**01**	**05**

10. වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර :

විෂයය	සහභාගි වූ	සම්පූර්ණ කරන ලද	ඉදිරිපත් කරන ලද
අ. පශ්චාද් උපාධි වැඩසටහන්			
ශල්‍ය ශාලක්‍ය		04	
ආ. පශ්චාද් ඩිප්ලෝමා වැඩසටහන්			
ඇ. උපාධි වැඩසටහන්			
ඈ. ඩිප්ලෝමා වැඩසටහන්			
ඉ. සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන්			
ද්‍රව්‍යගුණ විඥාන	03		
ඊ. වෙනත්			
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග	01		
ද්‍රව්‍යගුණ විඥාන	01		
මුළු ගණන	**05**	**04**	

11. සම්මාන ලැබීම් පිළිබඳ විස්තර :

	විෂයය	**සම්මාන ගණන**	**අධ්‍යයන කාර්ය මණ්ඩලය**	**සිසුන් ගණන**
අ. දේශීය සම්මාන	ශල්‍ය ශාලක්‍ය	01	✓	
	ද්‍රව්‍යගුණ විඥාන	03	✓	
ආ. ජාතික සම්මාන	කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග	01	✓	
ඇ. ජාත්‍යන්තර සම්මාන	ශල්‍ය ශාලක්‍ය	01		
ඈ. වෙනත්				
මුළු ගණන		**06**	**03**	

12. ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර :

අධ්‍යයනාංශය	**පාඨමාලාව**	**මාධ්‍යය**	**සහතික පත්‍ර**	**ඩිප්ලෝමා**	**පශ්චාද් ඩිප්ලෝමා**	**පශ්චාද් උපාධි**	**දර්ශනපති**	**දර්ශනශූරී**
ශල්‍ය ශාලක්‍ය	ක්ෂාරසූත්‍ර		✓					
	යෝග			✓				
කෞමාරභෘත්‍ය හා ස්ත්‍රීරෝග	ආයුර්වේද රූපලාවන්‍ය	සිංහල	✓					
	ස්කෑනින් පාඨමාලාව	සිංහල	✓					
ද්‍රව්‍යගුණ විඥාන	ආයුර්වේද ෆාමසි	සිංහල						
පශ්චාත් උපාධි අංශය	ආයුර්වේද ආයතනවල කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව							
මුළු ගණන			03	01				

13. පුනරාවර්තන වියදම් විස්තර :

විෂයය	2010	2011
අ. පුද්ගල පඩිනඩි	69,320,645	95,133,199
ආ. ගමන් වියදම්	214,634	189,848
ඇ. සැපයුම්	4,242,138	5,527,468
ඈ. නඩත්තු	3,961,463	2,957,349
ඉ. ගිණුම්ගත සේවා	12,438,411	16,590,316
ඊ. වෙනත්	3,930,162	4,928,760
මුළු ගණන	**94,107,453**	**125,326,940**

14. ප්‍රාග්ධන වියදම් විස්තර :

විෂයය	2010	2011
ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම	1,976,020	2,670,505
වත්කම් මිල දී ගැනීම්	2,553,656	7,379,375
ඉදිකිරීම්	32,742,461	92,979,290
මුළු ගණන	**37,272,137**	**103,029,170**

15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය) :

නම සහ විස්තර		ණය/ආධාර	ආධාර දෙන ආයතනය	මුළු පිරිවැය	අරමුදල් ලැබීම්	වෙනස
වෛද්‍ය බන්දුල වීරසූරිය මහතා	2006 2008 2009	753,000.00 753,000.00 700,000.00	National Centre for Advanced Studies	753,000.00 753,000.00 699,992.24	753,000.00 753,000.00 700,000.00	- - 7.76
වෛද්‍ය ඩබ්.ඒ.එල්. චන්ද්‍රසිරි මහතා	2006 2008 2009	687,150.00 687,150.00 687,150.00	National Centre for Advanced Studies	687,150.00 687,150.00 528,351.28	687,150.00 687,150.00 687,150.00	- - 158,798.72
වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මහතා	2009 2010	287,470.79	NCAS	219,747.79	275,000.00 12,470.79	55,252.21 12,470.79
කේ.එම්. චන්දිමාල් මහතා	2010 2011	750,000.00	U.G.C. Research Fund	250,000.00 1,794.05	250,000.00 250,000.00	248,205.95
වෛද්‍ය තිස්ස හේවාවිතාන මහතා	2008 2010 2011	250,000.00 250,000.00 124,800.00	U.G.C. Research Fund	250,000.00 194,655.00	250,000.00 250,000.00 124,800.00	194,655.00
වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය	2009	250,000.00	U.G.C. Research Fund	225,295.04	250,000.00	24,704.96
වෛද්‍ය රූපා මදනායක මෙනෙවිය	2009	250,000.00	U.G.C. Research Fund	221,918.91	250,000.00	28,081.09
වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මහතා	2010	500,000.00	U.G.C. Research Fund	268,392.62	250,000.00	(18,392.62)
වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය	2010	500,000.00	U.G.C. Research Fund	139,577.58	250,000.00	110,422.42
වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙනෙවිය	2010	500,000.00	U.G.C. Research Fund	310,157.14	250,000.00	(60,157.14)
වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය	2010	500,000.00	U.G.C. Research Fund	250,193.15	250,000.00	(193.15)
එස්.ඒ.ආර්.පී. දිසානායක මහතා	2010	55,000.00	U.G.C. Research Fund	12,000.00	55,000.00	43,000.00

16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර : (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය)

නම	මුළු පිරිවැය	වියදම් 2010	වියදම් 2011	සමුච්චිත වියදම් 2011.12.31 දිනට	ප්‍රගතිය (%)
වෛද්‍ය බන්දුල වීරසූරිය මයා	1,830,054.74	331,037.50	44,900.00	2,205,992.24	100
වෛද්‍ය ඩබ්.ඒ.එල්. චන්ද්‍රසිරි මයා	1,738,951.28	163,700.00	-	1,902,651.28	92
වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මයා	103,348.84	116,398.95	-	219.747.79	76
කේ.එම්. චන්දිමාල් මයා	-	66,116.85	185,677.20	251,794.05	100
වෛද්‍ය තිස්ස හේවාවිතාන මයා	77,246.00	146,345.00	158,549.00	382,140.00	100
වෛද්‍ය එච්.එස්. සකුන්තලා මිය	105,759.00	108,090.90	11,445.14	225,295.04	90
වෛද්‍ය රූපා මදනායක මෙව්	122,352.00	77,904.00	21,662.91	221,918.91	89
වෛද්‍ය ඒ.ඒ.ජේ. පුෂ්පකුමාර මයා	-	42,117.27	226,275.35	268,392.62	100
වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ. ජයසිංහ මිය	-	44,055.38	95,522.20	139,577.58	56
වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී. ජයකොඩි මෙව්	-	14,500.00	295,657.14	310,157.14	124
වෛද්‍ය එච්.පී. වක්කුඹුර මිය	-	41,868.25	208,324.90	250,193.15	100
එස්.ඒ.ආර්.පී. දිසානායක මයා	-	12,000.00	-	12,000.00	22

17. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) :

විෂයය	2011 ප්‍රතිපාදන	2011 වියදම්	ඉතිරි/ඉක්මයාම (සීමාව ඉක්මවීම)
අ. පුනරාවර්තන	111,099,198	130,182,576	
ආ. ප්‍රාග්ධන	137,300,000	103,029,171	
ඇ. ව්‍යාපෘති - දේශීය ආධාර			
ඈ. ව්‍යාපෘති - විදේශ ආධාර			
මුළු ගණන	**248,399,198**	**233,211,747**	

18. මූල්‍ය තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (අභ්‍යන්තර ආදායම) :

ආදායම් ප්‍රභවය	ප්‍රතිපාදන/වෙන්කිරීම් ඇස්තමේන්තු	ලැබීම් 2011	අඩු/වැඩි
අ. උපාධි අපේක්ෂක	2,600,000	4,692,934	
ආ. පශ්චාද් උපාධි			
ඇ. උපදේශක			
ඈ. වෙනත් - පාඨමාලා මුදල්	4,800,000	4,855,636	
මුළු ගණන	**7,400,000**	**9,548,570**	

19. මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2011 :

විෂයය	සංකේතය	ඒක ශිෂ්‍ය පිරිවැය
අ. ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් (පු.වි) පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව		337,808
ආ. ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රාග්ධන වියදම් (පු.වි) පු.වි/ශිෂ්‍ය සංඛ්‍යාව		277,706
මුළු ගණන		**615,514**

20. යටිතල පහසුකම් සඳහා 2011 වර්ෂය තුළ ලැබීම් :

යටිතල පහසුකම් පිළිබඳ විස්තර	වියදම්	ප්‍රගතිය
1. වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	2,670,505.82	55%
2. ඉදිකිරීම්	92,979,290.32	79%

21. වෙනත් විස්තර (වාර්තාවට අදාළ) :

21.1 පුස්තකාලය

2011 වර්ෂයේ පොත් ප්‍රතිග්‍රහණය කර ගැනීමේ සාරාංශය

විස්තරය	මිල දී ගැනීම	පරිත්‍යාග	එකතුව
පොත්	367	08	375
වාරික ප්‍රකාශන	07	-	07
පුවත්පත්	15	-	15

21.2 පරිගණක අංශය

පරිගණක අංශයේ කටයුතු සාර්ථකව මෙම වර්ෂය තුළ ද පවත්වාගෙන යාමට හැකි වූ අතර, ප්‍රමාණවත් සේවාවක් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ලබා දීමට හැකි විය.

21.3 යටිතල පහසුකම් සංවර්ධනය

- නව වෑන් රථයක් ආයතනයේ වාහන සංචිතයට එකතු කිරීමට හැකි විය.

- ඉදිවෙමින් පැවති ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ල 2011 නොවැම්බර් මාසයේ දී වැඩ නිම කරනු ලැබූ අතර පුස්තකාලය එහි ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කරනු ලැබිණි. ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ නිර්දේශිත කාර්යය ඉටු කිරීම ආරම්භ කරනු ලැබිණි.

- පැවති පැරණි ආපනශාලාව නව ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ස්ථාපනය කරනු ලැබීය.

අධ්‍යක්ෂ වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2011 වර්ෂයට අදාල මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව.

2011 වර්ෂය සඳහා ආයතනය වෙනුවෙන් මහාභාණ්ඩාගාරය විසින් ලැබුන අධාර මුදල් පහත දැක්වේ.

පුනරාවර්තන ආධාර

රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර	-	111.09
ආයතනය මගින් උපයන ලද පුනරාවර්තන ආදායම	-	9.54
	-	120.63

එකතු කළා

ක්‍රමක්ෂය	-	15.14
මුළු එකතුව (පුනරාවර්තන)	-	135.78

මූලධන ආධාර

වැය ශීර්ෂ	101	-	පුරුත්ථාපන සහ නඩත්තු සඳහා	-	4.90
වැය ශීර්ෂය	102	-	උපකරණ, පුස්තකාල පොත් හා	-	14.70
		-	වාර සඟරා අත්පත් කර ගැනීම		
වැය ශීර්ෂය	103	-	ගොඩකැගිලි ඉදි කිරීම්	-	117.70
මුළු එකතුව (ප්‍රාග්ධන)					137.30

ආදායම

2011 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රු. 111,099,108 ක් වන අතර, විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අනිකුත් පුනරාවර්තන ආදායම් මාර්ගවලින් ලබා ගත් මුදල රු. 9,548,570 හා ක්‍රමක්ෂය ගැලපීම් කටයුතු සමග රු. 15,132,899 ක් ද ඇතුළුව මුළු ආදායම රු.135.780,577 කි.

වියදම

2011 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රු. 145,315,475 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා වැඩියෙන් දරා ඇති වියදම රු.9,534,898 කි.

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2011 වර්ෂය තුළ රු. 15,132,899 වෙන් කර ඇත.

<u>වර්ෂයේ මූලධන ප්‍රතිපාදන ප්‍රතිඵලය</u>

වැය ශීර්ෂ අංක 101 - නඩත්තු හා වැඩි දියුණු කිරීම්

2011 වර්ෂය සඳහා 101 ව්‍යාපෘතිය යටතේ රු. 4,900,000 ක මුදලක් ආයතනයට වෙන් කෙරුණු අතර, වර්ෂයේ නඩත්තු හා වැඩිදියුණු වියදම් වශයෙන් රු. 2,670,505 ක මුදලක් වැය කර ඇත.

වැය ශීර්ෂ අංක 102 - කාර්යාල උපකරණ, අධ්‍යයන උපකරණ, පොත්පත් හා වාර සඟරා මිල දී ගැනීම්.

2011 වර්ෂය සඳහා රු. 14,700,000 ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ආයතනයට වෙන් කරන ලද අතර, අදාල මිල දී ගැනීම් සඳහා රු. 7,379,375 ක මුදලක් වැය කර ඇත.

වැය ශීර්ෂ අංක 103 - ඉදි කිරීම් කටයුතු

2011 වර්ෂය සඳහා රු. 117,700,000/- ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ආයතනයට වෙන් කරන ලද අතර, අදාල ඉදිකිරීම් කටයුතු සඳහා රු. 92,979,290 ක මුදලක් වැය කොට ඇත.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

2011.12.31 දිනට මූල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශනය

	2011		2010	
	Rs.	Rs.	Rs.	Rs.
වත්කම්				
ජංගම නොවන වත්කම්				
(අ) ඉඩම්	72,076,250		4,277,790	
(ආ) ගොඩනැගිලි	94,597,077		52,176,891	
(ඇ) කාර්යාල උපකරණ	17,480,430		8,890,518	
(ඈ) රසායනාගාර හා අධ්‍ය උපකරණ	18,479,240		2,328,077	
(ඉ) ලී බඩු හා සවි කිරීම්	11,889,987		2,882,946	
(ඊ) පුස්තකාල පොත් සහ සඟරා	8,173,590		2,167,215	
(උ) මෝටර් රථ වාහන	9,254,799		1,630,547	
(ඌ) යන්ත්‍රෝපකරණ	1,495,026	233,446,399	1,089	74,355,073
(එ) වෙනත්		1,614,356		1,866,855
(ඒ) නිම නොවූ වැඩ		102,426,246		9,446,956
(ඔ) මූලධන අත්තිකාරම්		8,994,661		24,537,845
ආයෝජන				
ස්ථාවර තැන්පත්		21,929,511		9,721,231
		368,411,173		**119,927,960**
ජංගම වත්කම්				
(අ) ගබඩා අත්තිකාරම්	1,765,401		2,333,509	
(ආ) ණය ගැතියෝ	1,497,840		1,139,840	
(ඇ) ණය සහ අත්තිකාරම්	19,715,790		19,091,896	
(ඈ) මිශ්‍ර අත්තිකාරම්	173,529		-	
(ඉ) පර්යේෂණ අත්තිකාරම්	41,500		53,500	
(ඊ) පෙර ගෙවීම	164,560		37,063	
(උ) බැංකු ශේෂය	73,197,699		29,277,564	
(ඌ) බැංකු ශේෂය (බාහිර පාඨමාලා)	275,770			
(එ) සුළු මුදල් ශේෂය	180		180	
(ඒ) වෙනත් වත්කම්	1,637,710	98,469,979	750,597	52,684,149
මුළු වත්කම්		466,881,152		172,612,109
වගකීම්				
(අ) ජංගම වගකීම්	282,750		441,450	
(ආ) ගෙවීම්	17,114,279		6,538,398	
(ඇ) උපචිත වියදම්	2,548,782	19,945,811	2,944,616	9,924,464
ජංගම නොවන වගකීම්				
(අ) පාරිතෝෂික දීමනා වෙන් කිරීම්		33,751,935		25,778,315
මුළු වගකීම්		53,697,746		35,702,779
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		413,183,406		136,909,330
ශුද්ධ වත්කම්/හිමිකම්				
(අ) වැය කළ ප්‍රාග්ධනය	215,099,344		127,203,071	
(ආ) වැය නොකළ ප්‍රාග්ධනය	42,898,001		8,627,173	
(ඇ) අරමුදල	(14,356,181)		(4,330,026)	
(ඈ) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන	169,542,242		5,409,112	
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		413,183,406		136,909,330

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

ඩබ්.ඒ.පී.එස්. මොලගොඩ
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ

ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

	2011 රු.	රු.	2010 රු.	රු.
මෙහෙයුම් ආදායම්				
පුනරාවර්තන ආධාර		111,099,108		89,525,000
ක්‍රමක්ෂය		15,132,899		9,583,323
වෙනත් ආදායම්				
(1) ණය සහ අත්තිකාරම් පොලී	759,447		809,686	
(2) විවිධ ලැබීම්	2,530,119		1,454,157	
(3) පොලී ආදායම	880,624		268,265	
(4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු	111,875		147,060	
(5) විභාග ගාස්තු	4,050		5,400	
(6) පුස්තකාල දඩ මුදල්	69,904		42,890	
(7) වෛද්‍ය ගාස්තු	18,060		18,530	
(8) දේපල වලින් වූ කුලී ආදායම්	318,855		190,965	
(9) ප්‍රකාශන විකුණුම්	-		-	
(10) පැරණි භාණ්ඩ විකුණුම් (රථ වාහන)	-		-	
(11) සම්බන්ධීකාරක ක්‍රියාකාරකම්	-		-	
(12) බාහිර පාඨමාලා ආදායම්	4,855,636		3,688,881	
		9,548,570		6,625,834
		135,780,577		**105,734,157**
මෙහෙයුම් වියදම්				
පුද්ගල පඩිනඩි	95,133,199		69,320,645	
ගමන් වියදම්	189,848		214,634	
සැපයීම	5,527,468		4,242,138	
නඩත්තු	2,957,349		3,961,463	
ගිවිසුම් ගත සේවා	16,590,316		12,438,411	
පර්යේෂණ සහ සංවර්ධන	263,132		318,670	
ක්ෂය වීම්	15,132,899		9,583,323	
වෙනත් මෙහෙයුම් වියදම්	4,665,628		3,611,492	
පාඨමාලා වියදම්	4,855,636		3,688,881	
මුළු මෙහෙයුම් වියදම්		**145,315,475**		**107,379,657**
මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය)		**(9,534,898)**		**(1,645,500)**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No } සිර්/එෆ්/ඩබ්ඒඅයි/2011/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2012 අගෝස්තු [illegible] දින

අධ්‍යක්ෂ,
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්ති සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය සහ 111 වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යායතනයේ අධ්‍යක්ෂකවරයා වෙත 2012 ජූනි 15 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද, ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කල කාර්යය මණ්ඩලය වෙනුවෙන් සේවක පාර්තෝෂික ප්‍රතිපාදනය කල යුතු වුවත් වර්ෂ 1 සිට 4 දක්වා සේවා කාලයක් සම්පූර්ණ කල කාර්යය මණ්ඩලය සඳහා සේවක පාර්තෝෂික ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 ට අනුව හැකි සෑම අවස්ථාවකදීම කාල පරිච්ඡේදය සඳහා වන ආදායම නිසිලෙස හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුලදී බාහිර පාඨමාලා සඳහා වැය කරන ලද රු.4,855,636 ක මුදල පදනම් කරගෙන බාහිර පාඨමාලා ආදායම් ලෙස රු.4,855,636 ක් ගිණුම්ගත කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පාඨමාලා පැවැත්වීමේ මුළු වියදම ඒ පාඨමාලා අතර විගරනය කිරීමේදී ආරෝග්‍යශාලා කළමනාකරණ පාඨමාලාව සඳහා වූ රු. 274,200 ක් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ආ) පර්යේෂණ සඳහා බාහිර ආයතන වලින් ලද රු.269,523 ක් ආචාර්යවරුන් තිදෙනෙකු වෙත ලබාදී තිබූ අතර එම පර්යේෂණ නිමවී වසර දෙකකට අධික කාලයක් ගතවී ඇතත් දරන ලද වියදම් පියවා ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකොට ශේෂ පත්‍රයේ නිශ්චිත අරමුදල් යටතේ දක්වා තිබුණි.

(ඇ) 2008 වර්ෂයේදී ආයුර්වේද ශික්ෂණ රෝහල ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර විද්‍යායතනය විසින් එම රෝහල වෙනුවෙන් ගෙවීම්කර තිබූ රු. 1,989,577 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබූ අතර එම මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන ගිණුම්වලට ඇතුලත්කර නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් වර්ගීකරණය හා ක්ෂය ප්‍රතිපාදනය

i. සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.2,723549 ක් වටිනා ලීබඩු හා සවිකිරීම් සහ රු.2,184,592ක් වටිනා යන්ත්‍රසූත්‍ර අදාල වත්කම් ගිණුම් වලට හර කරනු වෙනුවට කාර්යාල උපකරණ ගිණුමට හරකර තිබුණි. තවද මෙම වත්කම් 20 % බැගින් ක්ෂයකර තිබුණ අතර නිවැරදිව වත්කම් වර්ග කළේ නම් ක්ෂය අනුපාතය 10% ක් විය යුතුව තිබූ බැවින් රු.490,814 ක් වැඩිපුර ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

ii. පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.15,496,590 ක් වටිනා විවිධ ස්ථාවර වත්කම් වර්ග කිරීමකින් තොරව කාර්යාල උපකරණ ලෙස ගිණුම් ගතකර තිබුණි.

iii. ස්ථාවර වත්කම් ක්ෂය පිළිබඳව දක්වා ඇති ගිණුම් සටහනෙහි රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර සඳහා අදාල ක්ෂය ප්‍රතිශතය හෙළිදරව්කර නොතිබුණි.

2.3 පැහැදිලි නොකල වෙනස්කම්

විගණනයට ඉදිරිපත්කල කාර්යාල උපකරණ මිලට ගැනුම් උපලේඛණයට අනුව සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් කාර්යාල උපකරණවල වටිනාකම රු.6,651,345 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ස්ථාවර වත්කම් උපලේඛනය අනුව මිලදී ගැනුම් වටිනාකම රු.6,628,764 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.22,581 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම.
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
(i) මු.රෙ.104(2)	අලාභහානි පිළිබඳව විගණකාධිපතිට වාර්තා කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී වාහන තුනකට සිදුවී තිබූ රු.157,215ක අලාභය පිළිබඳව විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි.
(ii) මු.රෙ. 165	වර්ෂ 06 කට වඩා පැරණි රු.15,612 ක් වූ මුදල් ඇනවුම් 06 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපලබ්ධි වී නොතිබූ අතර එම මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.
(iii) මු.රෙ.371	කාර්යය නිමකල විගස එකී කාර්ය සඳහා ලබාගත් අත්තිකාරම් පියවියයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 33 කදී ලබාගත් රු.711,463 ක මිශ්‍ර අත්තිකාරම් දින 15 සිට දින 113 දක්වා ප්‍රමාද වී පියවා තිබුණි.

(ආ) අංක PAYE/Tax/01/2011හා

2011 අප්‍රේල් 18 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛය	උපයන විට ගෙවීම් බදු අඩු කරගෙන ඊළඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී මාස 01 සිට මාස 09 දක්වා ප්‍රමාද කර දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීම් කර තිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.120,634,006 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.91,170,500 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.111,099,108 ක ප්‍රදාන හේතුවෙන් ඌනතාවය රු.9,534,898 දක්වා අඩුවී තිබූ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 89,525,000 ක ප්‍රදානය හේතුකොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 1,645,500 දක්වා අඩුවී තිබුණි.

පෙර වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී විද්‍යායතනයේ ඌනතාවය රු. 7,889,398 කින් වැඩිවීමට පුද්ගල පඩිනඩි, ගිවිසුම්ගත සේවා සඳහා වූ වියදම් වැඩිවීම හා ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>අධ්‍යයන කාර්ය සාධනය</u>

බඳවා ගන්නා සිසුන් සියලු දෙනාම අවසාන විභාගය සඳහා පෙනී නොසිටින බව අධ්‍යයන වර්ෂ පහක ශිෂ්‍ය ලියාපදිංචිය හා අවසාන විභාග සමත්වීම පිළිබඳව පහත උපලේඛනය අනුව නිරීක්ෂණය වන අතර මෙම අධ්‍යයන වර්ෂ වල බඳවාගත් සිසුන්ගෙන් 6.5% සිට 23.1% අතර පරාසයක සිසුන් අවසාන විභාගයට පෙනී සිට නොතිබුණි.

ලියාපදිංචි අධ්‍යයන වර්ෂය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව	අවසාන විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	විභාගය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව
2005/2006	53	47	46
2004/2005	26	22	22
2003/2004	78	60	60
2002/2003	46	43	43
2001/2002	61	56	56

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පර්චස් 1996 ක් වූ බිම් කොටස් 04 ක් දීර්ඝ කාලයක සිට ආයතනයේ දෛනික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා නමුත් ආයතනයේ නමින් හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව, 2011 දෙසැම්බර් 31 දිනට භාවිතයට ගත නොහැකි රු. 48,667 ක් වූ භාණ්ඩ තොග සම්බන්ධයෙන් 2012 අප්‍රේල් 30 දින වන විටත් සුදුසු පියවර ගෙන නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රු.824,000 ක පිරිවැයකට 2010 වර්ෂයේදී බාහිර පාර්ශ්වයක් ලවා පිළියෙල කර ප්‍රයෝජනයට ගත් පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් ලේඛනය 2009 දෙසැම්බර් 31 දිනෙන් පසු, ස්ථාවර වත්කම් මිලට ගැනුම් හා ඉවත් කිරීම් ඇතුලත්කර යාවත්කාලීන කර නොතිබුණි.

4.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

උපාධි අපේක්ෂක වැඩසටහන් සංවර්ධනය සඳහා 2010 ඔක්තෝබර් 01 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රු.මිලියන 03 ක් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.5 <u>ආර්ථික නොවූ ගණුදෙනු</u>

2010 සැප්තැම්බර් 28 දින ආයතනය විසින් රැහැන් රහිත සෘජු හා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් මිලදී ගැනීම සඳහා රු. 277,140 ක් ගෙවීම් කර තිබුණු අතර පද්ධතියෙන් යහපත් සන්නිවේදනයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද මෙම පද්ධතියේ අභ්‍යන්තර දුරකථන එකක් සඳහා මසකට රු.375 ක් බැගින් දුරකථන 50 ක් වෙනුවෙන් වර්ෂයකට රු. 225,000 ක් ගෙවීම් කරමින් පැවතුණි.

4.6 <u>අරමුදල් ඌන උපයෝජනය</u>

බැංකු ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම ගෙවීම් කිරීමෙන් පසුව රු.18,600,000 ක අවම මුදල් ශේෂයක් පවත්වාගෙන ගොස් තිබූ අතර අතිරික්ත මුදල් කෙටි කාලීන ආයෝජනයක යොදවා ප්‍රතිලාභ ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

5. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

5.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී 44% සිට 72% දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

අ. ගිණුම්කරණය

ආ. විවිධ අත්තිකාරම්

ඇ. මූල්‍ය පාලනය

ඈ. කොන්ත්‍රාත් පරිපාලනය

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE
UNIVERSITY OF KELANIYA, YAKKALA.

අධ්‍යක්ෂ Director	033-2222730	නියෝජ්‍ය ලේඛකාධිකාරී (පාලන) Deputy Registrar (Admin) ෆැක්ස්/Fax	033-2226618 033-2223784	නියෝජ්‍ය මුදලාධිකාරී Deputy Bursar ෆැක්ස්/Fax	033-2223785 033-2223785
ෆැක්ස් Fax	033-2222738	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (විභාග) Senior Assistant Registrar (Exams)	033-2223784	සහකාර මුදලාධිකාරී (සැපයුම්) Assistant Bursar (Supplies)	033-3340105
සාමාන්‍ය General Office	033-2222740-2222748 033-3340101	සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සේවා) Assistant Registrar (Student affairs)	033-3340106	ඊ මේල් E-mail	ayurgmp@sltnet.lk

මගේ අංකය My Number } ජීඩබ්ලිව්ඒඅයි/ජීපී4/2011 විගණන   ඔබගේ අංකය Your Number } සීඊ/එච්/ජීඩබ්ලිව්ඒඅයි/2011/ඒෆ්ඒ   දිනය Date } 2012.10.02

එච්.ජේ. එස්. සමරවීර මහතා,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72 පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඉහත සඳහන් වාර්තාව සම්බන්ධයෙන් මේ වන විට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් මෙසේ දක්වමි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

1.3 විගණකගේ වගකීම

1.4 මූල්‍ය ප්‍රකාශන

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්වාගණනය කළ මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ස්ථිර සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සේවක පාරිතෝෂික අරමුදල් ගණනය කර ඇති අතර එම ගණනයට අනුව මුදල් ප්‍රතිපාදනය 2012 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ගැලපීම් සිදු කිරීමට නියමිතව ඇත.

(ආ) ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිතයට අනුව බාහිර පාඨමාලාවන්ගෙන් ලැබෙන සියලුම ආදායම් ගිණුම් ගත කෙරේ.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ජ'නල් අංක 110/2012 මගින් නිවැරදි කර ඇත.

(ආ) ආචාර්යවරුන් තිදෙනෙකුගේ පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබුණු මුදලින් පර්යේෂණ දෙකක මුදල් මේ වන විට නිරවුල් වී ඇත. ඉතිරි පර්යේෂණයේ කටයුතු දැනටත් සිදුවෙමින් පවතී.

(ඇ) ජ'නල් අංක 111/2012 මගින් නිවැරදි කර ඇත. ලැබිය යුතු මුදල් පිළිබඳව නැවතත් අදාළ දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා ඇත.

(ඈ) <u>ස්ථාවර වත්කම් වර්ගීකරණය හා ක්ෂය ප්‍රතිපාදන</u>

(1) ජ'නල් අංක 112/2012 මගින් නිවැරදි කර ඇත.

(11) ජ'නල් අංක 113/2012 මගින් නිවැරදි කර ඇත.

(111) නිවැරදි කර ඇත.

2.3 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

මිල දී ගත් උපකරණ සම්බන්ධයෙන් උපලේඛනවල පැවති රු.22,581/- ක වෙනස හඳුනාගැනීමෙන් අනතුරුව නිවැරදි කර ඇත.

2.4 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(1) **මු. රෙ. 104(2)**

අලාභහානි පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට සටහන් කරගෙන ඇත.

(11) **මු.රෙ. 165**

උපලබ්ධි කර ගැනීමට ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කර ඇත.

(111) **මු.රෙ. 371**

අත්තිකාරම් මුදල් නියමිත කාල වකවානු වලට අනුව පියවීමට හැකි සෑම අවස්ථාවකම කටයුතු කෙරේ. නොවැලැක්විය හැකි හේතූන් මත සමහර අත්තිකාරම් මුදල් පියවීම ප්‍රමාදවන අවස්ථා ඇත.

(ආ) අංක PAYE/Tax/01/2011 හා 2011 අප්‍රේල් 18 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය

1. නියමිත දිනට චෙක්පත් යැවීමට කටයුතු කෙරේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අධ්‍යයන කාර්යසාධනය

පාඨමාලා ඒකක ක්‍රමය හඳුන්වාදීම මත මෙම තත්වය අඩුවන ඇතැයි බලාපොරොත්තු වේ.

4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේදී සිදුව ඇති දෝෂය නිවැරැදි කිරීමට කටයුතු කෙරේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අනුව භාවිතයට ගත නොහැකි අබලි භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු කර ඇත.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ස්ථාවර වත්කම් ලේඛනය 2009 දෙසැම්බර් 31 දිනෙන් පසු මිලට ගැනීම් ඇතුලත් කර යාවත්කාලීන කර ඇත.

4.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

උපාධි අපේක්ෂක වැඩ සටහන් සංවර්ධනය සඳහා ලැබුණු මුදල් ප්‍රතිපාදන අදාළ කටයුතු සඳහා වැය කර ඇත.

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

ආයතනයේ අභ්‍යන්තර දුරකථන පද්ධතියේ පවතින දෝෂ තත්වය පිළිබඳව ටෙලිකොම් ආයතනයට දැනුම් දී ඇති අතර, ඒ සඳහා ආයතනයට සිදු වී ඇති පාඩුව මගහරවා ගැනීමට PABX පද්ධතියක් නොමිලේ ලබා දීමට එකඟතාව පළකර ඇත. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදු වෙමින් පවතී.

4.6 අරමුදල් ඌන උපයෝජනය

ජංගම ගිණුමේ පවත්නා ශේෂ මුදල් අදාළ ගෙවීම් සිදුවන තුරු කෙටිකාලීනව ආයෝජනය කර ඇත.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගීකර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

දක්වා ඇති ක්ෂෙත්‍රයන් යටතේ අඩුපාඩු අවම කර ගැනීමට විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කිරීමට එකඟ වෙමි.

අධ්‍යක්ෂ,
මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ

පිටපත් -

1. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
2. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යංශය
4. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය